# දැන්වීමයි.

## කෘෂිකර්ම අමාත්‍යාංශය
## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව – පේරාදෙණිය
## 2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පේරාදෙණියේ පිහිටි ප්‍රධාන කාර්යාලයට හා සියළුම පරිපාලන දිස්ත්‍රික්ක යටතේ ඇති දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සඳහා 2019 වර්ෂයට අවශ්‍ය පහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීම වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## A - සැපයීම්.

**01. ලිපිද්‍රව්‍ය**

I. සියළුම කඩදාසි වර්ග, සී.ආර්.පොත්, ලඝු පොත්, ක්ෂේත්‍ර පොත් , ස්ටෙන්සිල්, ෆයිල් කවර, කාබන් කොල, ලිපි කවර, පෑන් වර්ග, අල්පෙනෙත්ති, ක්ලිප්ස්, ටිපෙක්ස්, හයිලයිට් හා ටේප් ආදී සියළුම ලිපිද්‍රව්‍ය.
II. ටෝනර් වර්ග හා රිබන් වර්ග

**02. කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ.**

I. ගණක යන්ත්‍ර, දුරකථන උපාංග, ෆැක්ස් යන්ත්‍ර, ජායා පිටපත් යන්ත්‍ර, අනුපිටපත් යන්ත්‍ර ආදිය.
II. (a) පරිගණක යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, පරිගණක මෘදුකාංග ආදිය.
(b) පරිගණක අමතර කොටස්/උපාංග
III. දින මුද්‍රා හා රබර් මුද්‍රා
IV. ලී බඩු, වානේ ගෘහ භාණ්ඩ, ප්ලාස්ටික් හා ෆයිබර් ගෘහ භාණ්ඩ ආදිය.

**03. විදුලි උපකරණ.**

I. විදුලි පංකා, විදුලි කේතල, බොයිලේරු, විදුලි බුබුළු, වයර්, පි.වී.සි. කේබල්, විදුලි ආරක්ෂක උපාංග හා විදුලි උපාංග,බෙදාහැරීමේ පුවරු ආදිය.
II. විදුලි යතුරු හා යතුරු පුවරු.
III. විදුලි මාන උපකරණ, විදුලි මීටර්
IV. වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ
V. අකුණු සන්නායක හා අදාල උපාංග ආදිය

**04. ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ.**

I. ශ්‍රව්‍ය දෘශ්‍ය කැසට් පටි, සංයුක්ත තැටි.
II. මහජන ඇමතුම් පද්ධති.
III. වීඩියෝ හා නිශ්චල ඩිජිටල් කැමරා.
IV. බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර
V. වෙනත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපාංග (ශ්‍රවණාගාර,ශබ්දාගාර,ගුවන් විදුලි වැඩසටහන් පටිගත කිරිම හා විකාශය)
VI. ආරක්ෂක කැමරා (CCTV) පද්ධති.
VII. ඩිජිටල් පුලුල් මුද්‍රණ යන්ත්‍ර හා මුද්‍රිත ද්‍රව්‍ය ආදිය.

**05. රසායනාගාර උපකරණ, රසායන ද්‍රව්‍ය**

I. රසායනාගාර උපකරණ.
II. පළිබෝධනාශක, රසායනික පොහොර, කාබනික පොහොර ආදිය.
III. ජායාරූප පිරිසිදු කිරීමට ගන්නා රසායන ද්‍රව්‍ය,
IV. වෙනත් සියළුම වර්ගවල රසායන ද්‍රව්‍ය.
V. සත්ව ආහාර.

06. **කෘෂිකාර්මික උපකරණ හා ද්‍රව්‍ය.**

I. ට්‍රැක්ටර් හා ආම්පන්න.
II. බලවේග ඉසින යන්ත්‍ර, වතුර පොම්ප ආදිය.
III. කෘෂිකාර්මික යන්ත්‍ර හා සැහැල්ලු කෘෂිකාර්මික උපකරණ (උදළු, පිහියා ආදිය).
IV. ටියුබ්ස්, දැල් වර්ග ආදිය.
V. ඇසුරුම් ද්‍රව්‍ය (පොලිතීන්, ගෝනි, පොලිසැක් මළු, ත්‍රිත්ව ආස්තරණ ඇළුමිණියම් ෆොයිල් ආදී)
VI. ක්ෂුද්‍ර ජල සැපයුම් පද්ධති හා අමතර කොටස්

07. **රෙදි පිළි.**

I. නිල ඇඳුම් රෙදි, තිර රෙදි, මේස රෙදි ආදිය.

08. **මෝටර් රථ අමතර කොටස්.**

I. ටයර් සහ ටියුබ්, රිම් හා වාහන සඳහා බැටරි
II. වෙනත් මෝටර් රථ අමතර කොටස්.
III. යතුරු පැදි සඳහා අමතර කොටස්.
IV. සීට් කවර හා කාපට්.
V. වාහන සඳහා කැසට් යන්ත්‍ර

09. **පාරිභෝගික ද්‍රව්‍ය**

I. විවිධ සබන් වර්ග, විෂබීජ නාශක, එයාර් ෆ්‍රෙෂ්නර් ආදිය.
II. කොසු, ඉදල්, වියළි කෝෂ (බැටරි) ආදිය.

10. **ගොඩනැගිලි ද්‍රව්‍ය**

I. ගොඩනැගිලි ද්‍රව්‍ය හා සියළුම තීන්ත වර්ග.
II. ජල නල හා උපාංග
III. ඉරු දැව වර්ග
IV. හරිතාගාර සඳහා අවශ්‍ය සෙවිලි තහඩු
V. පැළැටි ගෘහ සඳහා අවශ්‍ය දැල් වර්ග
VI. හදිසි ගිනිනිවීමේ උපකරණ

11. **මුද්‍රණ ද්‍රව්‍ය**

I. මුද්‍රණාලය සඳහා අවශ්‍ය තීන්ත, මුද්‍රණ රසායන ද්‍රව්‍ය, මුද්‍රණ කඩදාසි, ස්ක්‍රීන් රෙදි ආදි මුද්‍රණ ද්‍රව්‍ය
II. විවිධ පොත් වර්ග, බයින්ඩින් ටේප්, රෙක්සින් හා කෙම්පික්ස් ගම් ආදිය
III. මුද්‍රණ යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර අමතර කොටස් හා මුද්‍රණ ප්ලේට් ආදිය
IV. පැල සඳහා යොදන ලේබල් මුද්‍රණය කිරීමට අවශ්‍ය පී.වී.සී. ස්ටිකර්
V. පලතුරු පැල සහතික කිරීම සඳහා ස්ටිකර් සැකසීම වෙනුවෙන් පී.වී.සී. ස්ටිකර් පත්‍ර හා අනෙකුත් ස්ටිකර් පත්‍ර වර්ග
VI. බීජ පරීක්ෂණාගාර කටයුතු වෙනුවෙන් වාර්තා සැකසීම සඳහා කාබනීකරණය කරන ලද (Carbonize) මුද්‍රණ කඩදාසි

12. **වෙනත් සැපයීම්**

I. උත්සව සඳහා තාවකාලික ආවරණ, විදුලි සේවා, ශබ්දවාහිනී යන්ත්‍ර, පුටු ආදිය සැපයුම්කරුවන්, පිසින ලද ආහාර වර්ග.
II. කොහු ආශ්‍රිත නිෂ්පාදන
III. පිඟන් භාණ්ඩ
IV. මී මැසි පාලන උපකරණ
V. වැඩපල උපකරණ හා ආයුධ (යාන්ත්‍රික/සිවිල්/ඉලෙක්ට්‍රොනික/පරිගණක)

13. **කාර්මික නිෂ්පාදන හා අමුද්‍රව්‍ය**

I. යකඩ හා ලෝහ වර්ග.
II. බෙයාරිං වර්ග
III. බෙල්ට් හා කප්පි වර්ග
IV. බීජ සැකසුම් යන්ත්‍ර හා අස්වනු නෙලන යන්ත්‍ර සඳහා අවශ්‍ය උපාංග සැපයීම

14. **පවිත්‍රතා කටයුතු සහ සනීපාරක්ෂක සේවාවන්**

## B - සේවාවන්.

01. මෝටර් රථ විදුලි පද්ධති අළුත්වැඩියා කිරීම.
02. මෝටර් රථ වායුසමීකරණ අළුත්වැඩියා.
03. මෝටර් රථ යාන්ත්‍රික අළුත්වැඩියා.
04. මෝටර් රථ ඉංජෙක්ටර් පොම්ප අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම.
05. මෝටර් රථ සේවා කිරීම.
06. මොටර් රථ ටින්කරින් කිරීම හා පිංතාරු කිරීම.
07. ලොරි බොඩි ගැසීම.
08. ට්‍රැක්ටර් / හයිඩ්‍රොලික් පද්ධති සහා කෘෂි යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව.
09. එන්ජින් බ්ලොක් රී බෝරිං කිරීම සහ අදාල අලුත්වැඩියා.
10. සියළුම වර්ගවල විදුලි උපකරණ හා කාර්යාල උපකරණ (විදුලි හා වෙනත්) අලුත්වැඩියා කිරීම.
11. පරිගණක හා පරිගණක උපාංග අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සේවා කිරීම.
12. පරිගණක ජාලගත කිරීම.
13. පරිගණක සර්වර් පද්ධති කුලී පදනම මත ලබා දීම.
    i. Domain Name Registration
    ii. Configuration, Maintatenances
    iii. Failure Recovery

14. සී.ඩී / ඩී.වී.ඩී. Replication and Backside printing
15. මුද්‍රණ යන්ත්‍ර/ග්‍රැෆික් උපකරණ අළුත්වැඩියා කිරීම.
16. මුද්‍රණ යන්ත්‍ර/ඡායා පිටපත් යන්ත්‍ර නඩත්තු කිරීම සහ සේවා කිරීම.
17. පර්ෆෙක්ට් බයින්ඩින්,සෙක්ෂන් බයින්ඩින්, ලැමිනේටින් හා වර්ණ විභේදනය කර පොසිටිව් සෑදීම.
18. මුද්‍රණ යන්ත්‍ර රබර් රෝල් පිරවීම.
19. වර්ණ මුද්‍රණ කටයුතු සිදු කිරීම.
20. ඡායා පිටපත් යන්ත්‍ර / ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සේවා කිරීම.
21. වීඩියෝ හා නිශ්චල කැමරා හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ අලුත්වැඩියා කිරීම.
22. අභ්‍යන්තර දුරකථන හුවමාරු පද්ධති (PABX) නඩත්තු කිරීම හා සේවා කිරීම.
23. ආරක්ෂක කැමරා පද්ධති (CCTV) නඩත්තු කිරීම හා සේවා කිරීම.
24. විදුලි ජනක යන්ත්‍ර සේවා සැපයීම/ අලුත්වැඩියා කිරීම
25. විදුලි සංදේශ උපකරණ සැපයුම් හා සේවා (මේ සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය තිබිය යුතුය).
26. ශීතාගාර ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම.
27. හරිතාගාර හා දැල් ගෘහ ඉදි කිරීම,
28. බීජ පැකට් කිරීම.
29. පළතුරු බීජ ඇට සැපයීම.
30. බද්ධ පැල සඳහා ප්ලාස්ටික් බඳුන්, පොලිතීන්, ස්ටිකර් සැපයීම.
31. ක්ෂුද්‍ර වාරි පද්ධති ස්ථාපිත කිරීම.
32. ජල සම්පාදන පද්ධති සඳහා උපකරණ සැපයීම හා සේවාවන් කිරීම.
33. රසායනාගාර උපකරණ අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම.
34. ගොවිපලවල සී සෑම, කුඹුරු නියර බැඳීම, ගොයම් කැපීම, ගොයම් මැඩීම ආදී කටයුතු.
35. ජෛව තාක්ෂණ විද්‍යාගාර උපකරණ අළුත්වැඩියා කිරීම.
36. නළ ළිං ඉදිකිරීම.
37. දොඹකර හා පස් ඉවත් කිරීමේ සේවා සැපයීම.
38. පලතුරු පැල සඳහා යොදා ගනු ලබන පී.වී.සී. හා අනෙකුත් ස්ටිකර් පත්‍ර මුද්‍රණය කිරීම.
39. බීජ පරීක්ෂණ ප්‍රතිඵල, වාර්තා සටහන් පොත් (Carbonized paper) මුද්‍රණය කර ගැනීම
40. අනතුරුදායක ලෙස පිහිටි ගස් කපා ඉවත් කිරීම.
41. මෝටර් රථ සීට් කවර හා අපෝස්ට්‍රින් අළුත්වැඩියා කිරීම
42. මෝටර් රථ සඳහා වායු විමෝචන සහතික ණය පදනම මත ලබාදීම.
43. CCTV කැමරා වැනි උපකරණ සපයා සවි කිරීම.
44. ඉදිකිරීම් යන්ත්‍ර කුලී පදනම මත ලබාදීම.

45. තොරතුරු පද්ධති / දත්ත වැඩසටහන් හා මෘදුකාංග සංවර්ධනය.
46. විසිතුරු මල්පැල වර්ග සැපයීම.
47. යකඩ වැට හා ගේට්ටු ඉදිකිරීම සහ රාක්ක ගැසීම.
48. කොන්ත්‍රාත් කම්කරු සේවාන් සැපයීම.
49. ආරක්ෂක සේවාවන් සැපයීම.
50. Germinator අළුත්වැඩියා කිරීම.
51. Drying cabinet අළුත්වැඩියා කිරීම.
52. ගිණි නිවීමේ උපකරණ සැපයීම හා නඩත්තුව.
53. අධිධාරිතා වතුර ටැංකි ෆයිබර් සහ ප්ලාස්ටික් සැපයීම හා අළුත්වැඩියා කිරී

<u>**අයදුම්පත් ඉදිරිපත් කිරීම.**</u>

(අ) 2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන අයදුම්පත් සම්පූර්ණ කර, A - සේවාවන් යටතේ වූ අයදුම්පත්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අංක 25, පරණ ගලහ පාර, පේරාදෙණිය, යන ලිපිනයටත්, B - සේවාවන් යටතේ වූ අයදුම්පත්, ප්‍රධාන ඉංජිනේරු, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයටත් 2019.12.25 දිනට ප්‍රථම ලැබෙන සේ ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ **සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2019** යනුවෙන් සඳහන් කළ යුතුය.

(ආ) ඒ සඳහා වන අයදුම්පත් 2019.12.25 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්වල නියමිත කාර්යාල වේලාවන් තුල පහත සඳහන් ස්ථානවලින් නොමිලේ ලබාගත හැක.

**අයදුම් පත් ලබාගත හැකි ස්ථාන -**

- A යටතේ වන සැපයීම් සඳහා අයදුම්පත් පේරාදෙණිය, පරණ ගලහ පාරේ, අංක 25 දරණ ස්ථානයේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පරිපාලන අංශයේ ප/2 ශාඛාවෙන් ලබාගත හැක.
- B යටතේ වන සේවාවන් සැපයීම සඳහා වන අයදුම්පත්, උක්ත ලිපිනයේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු අංශයෙන් ලබා ගත හැක.

(ඇ) ඉහත දක්වා ඇති එක් එක් කාණ්ඩය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. එම එක් එක් අයදුම් පත්‍රය සඳහා ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 500/- ක **කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්** නමට මහජන බැංකුවේ අංක.057100139027201 හෝ ලංකා බැංකුවේ අංක.0007042565 දරණ ගිණුම්වලට බැර කර ලබාගන්නා කුවිතාන්සියේ පිටපත අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය. නැතහොත් මෙම දෙපාර්තමේන්තුවේ සරප් වෙත එකී මුදල ගෙවා ලබා ගත් කුවිතාන්සිය අයදුම්පතට අමුණා එවිය යුතුය.

(ඈ) **ලියාපදිංචි කිරීම සඳහා සලකා බලනුයේ, ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ සඳහන් සැපයුම් හෝ සේවාවන් සැපයීම සඳහා පමණක් බැවින්, අයදුම්පත සමඟ ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ ජායා පිටපතක්ද එවිය යුතුය.**

(ඉ) A සැපයීම් හා B සේවාවන් සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කල යුතුය. එක් කාණ්ඩයකට වඩා ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කරන ආයතන ඉහත සඳහන් පරිදි සකස් කරන ලද අයදුම්පත් එක කවරයක එවිය හැකිය. එහෙත් ඉහත (ඇ) ඡේදයේ සඳහන් ගාස්තු එක් එක් කාණ්ඩය වෙනුවෙන් ගෙවිය යුතු අතර සෑම අයදුම්පත්‍රයක් සමඟම ව්‍යාපාර නාම ලියාපදිංචියේ පිටපතක් අමුණා එවීම අනිවාර්යය වේ.

(ඊ) ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන් අතුරෙන්, මිල ගණන් ඉදිරිපත් නොකරන්නා වූ ද. අවශ්‍යතාවයට අනුකූලව නියමිත කාලය තුල සැපයුම් / සේවා නොසපයන්නානාවූ ද සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ඇත.

(උ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2018.11.    දින,
පේරාදෙණිය, පරණ ගලහ පාරේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

# කෘෂිකර්ම අමාත්‍යාංශය
## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - පේරාදෙණිය
## 2019 වර්ෂයේ සිවිල් ඉදිකිරීම් හා නඩත්තු
## වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2019 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සිවිල් ඉදිකිරීම් නඩත්තු හා අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම පිණිස, පළාත් වශයෙන් හා කොන්ත්‍රාත් අගයන් අනුව ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

එක් කොන්ත්‍රාත්කරුවෙකුට ඕනෑම පළාත් දෙකකට ඉල්ලුම්පත් ඉදිරිපත් කල හැකි අතර, එම පළාත් දෙකේ කොන්ත්‍රාත් අගයන් දෙකටම වුවද ඉල්ලුම් කළ හැකි අතර එම ඉල්ලුම්පත්‍ර එක කවරයක බහා එවිය හැක. එක් එක් කාණ්ඩය සඳහා එක් පළාතකට ලියාපදිංචි ගාස්තුව පහත දැක්වේ.

| **කොන්ත්‍රාත්තුවේ වටිනාකම** | **ලියාපදිංචි කිරීමේ ගාස්තුව** |
|---|---|
| රු 1,000,000/- දක්වා | රු 1,000/- |
| රු 1,000,000/- සිට 2,000,000/- දක්වා | රු 1,500/- |

ගොඩනැගිලි වැඩ සඳහා ඉදිකිරීම් පුහුණු කිරීම් හා සංවර්ධන ආයතනයේ දැනට ලියාපදිංචි අයදුම්කරුවන්ට පමණක් අදාල ඉල්ලුම්පත් නිකුත් කරනු ලැබේ. තවද රු 1,000,000/- සිට 2,000,000/- දක්වා ලියාපදිංචි වන කොන්ත්‍රාත්කරුවන් ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ සාමාජිකත්වය ලබා සිටිය යුතුය.

ඉහත අවශ්‍යතා සනාථ කිරීම සඳහා ලියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු අදාල ඉල්ලුම්පත් ප්‍රධාන ඉංජිනේරු, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, තැ.පෙ. අංක 08, පේරාදෙණිය යන ලිපිනයෙන් ගෙවීමකින් තොරව ලබාගත හැක. එම ඉල්ලුම් පත්‍ර 2019.12.25 දිනට ප්‍රථම ඉහත ලිපිනයට යොමු කල යුතු අතර, ඉල්ලුම් පත් ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **සිවිල් ඉදිකිරීම් හා නඩත්තු වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2019** යනුවෙන් සඳහන් කල යුතුය. අදාල ඉල්ලුම්පත්‍රය අනුව ඉදිරිපත් නොකරන්නාවූ අසම්පූර්ණ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිකිරීම්, පුහුණු කිරීම් හා සංවර්ධන ආයතන විසින් නිකුත් කර ඇති ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා එවීම අනිවාර්ය වන අතර රු 1,000,000/- සිට 2,000,000/- දක්වා ලියාපදිංචි වන කොන්ත්‍රාත්කරුවන් ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීමේ සංගමයේ සාමාජිකත්ව සහතිකයේ පිටපතක්ද අමුණා එවිය යුතුය.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2019.11. දින,
පේරාදෙණිය, පරණ ගලහ පාරේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.